

Our practice is based on three main principles; Fairness, Compassion and Deliver Results. We pledge our commitment to further enhance these principles in our service to you........

Susantha Katugampala

**SUSANTHA KATUGAMPALA**
LL B (Monash)

Barrister & Solicitor
Registered Migration Agent: 96/86306
Australian qualified
and experienced Sri Lankan Lawyer

**FAIRFIELDS**
IMMIGRATION LAWYERS - MELBOURNE

10, Morrison Place, East Melbourne 3002
Telephone: 03 9650 4557 Fax: 03 9650 4559
Interstate Callers: 1300 888 331

Email: fairfields.lawyers@bigpond.com

We Deliver Results.....

Design / Waruna Savinda / 0402 894 942


ත්‍රස්තවාදී ප්‍රශ්නයට විසඳුමක් ලැබෙන්නේ කියලා.

***ඔබ හිතන්නේ නැද්ද 'ඒකීය ශ්‍රී ලංකාවක්'' යටතේ පරිපාලනය විමධ්‍යගත කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියලා.***

නෑ. කොහොමවත් නෑ. මම කියන්නේ එක්සත් ශ්‍රී ලංකාවක් යටතේ බලය බෙදීමක් කිරීමෙන් පමණයි මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වන්නේ.

***ඇතැම් අය ප්‍රකාශ කරන දෙයක් තමයි ඉදිරිපත් කරන යෝජනාවලිය කුමක් වුවත්, එය කොටි සංවිධානය පිළිගත යුතු එකක් විය යුතු බවට. එසේ නැතුව වැඩක් නෑ. ඔබ විශ්වාස කරන ආකාරයට ඔබ පක්ෂය රජයට ඉදිරිපත් කර ඇති යෝජනාවලිය කොටි සංවිධානය පළිගනීවිද?***

මෙහෙමයි. අප පක්ෂය ඉදිරිපත් කර ඇති යෝජනාවලියට කාටවත් විරුද්ධ වෙන්න බෑ. එය කිසිඳු පැකිලීමකින් තොරව කාටත් පිළිගත හැකි දෙයක් තමයි ඉදිරිපත් කර ඇත්තේ.

මොකද පළාත් සභා ක්‍රමය මේ ප්‍රශ්නයට හොඳ විසඳුමක්. එම ක්‍රමය උපරිම බලය බෙදීමක් හරහා ස්ථාපිතත කළොත් මේ ප්‍රශ්නය විසඳීම එතරම් අපහසු වෙන්නේ නෑ. ඒ නිසා රජය මේ පිළිබඳව සිය අවධානය යොමු කළ යුතුයි. අපි ඉදිරිපත් කර ඇති යෝජනාවලට කොටි සංවිධානයටවත් විරුද්ධ වෙන්න බෑ. ඒ අයටත් පිළිගත හැකි දෙයක් තමයි අපි ඉදිරිපත් කර ඇත්තේ.



*ඊ.පී.ඩී.පී. සංවිධානයත් කාලයක් දෙමළ රාජ්‍යයකට සටන් කළා. නමුත් 1987 දී අත්සන් කළ ඉන්දු ලංකා ගිවිසුම හා පළාත් සභා ක්‍රමය හරහා අපි ප්‍රසිද්ධ දේශපාලනයට ප්‍රවිෂ්ට වුණා. එදා කොටි සංවිධානයට එහෙම එන්න තිබුණා. නමුත් ඔවුන් ආවේ නෑ. එහෙම ආවා නම් අද මේ වගේ යුදමය ප්‍රශ්නයක් නැති වෙන්න තිබුණා.*

ඒක නිසා කොටින්ට කැමැත්තෙන් හෝ අකමැත්තෙන් මෙය පිළිගැනීමට සිදුවෙනවා. එහෙම නැතුව ඉන්න බෑ. ඊටත් මේ යෝජනාවලියට කොටි විරුද්ධ වුවහොත් ඉන් අවාසි සිදුවන්නේ කොටින්ටමයි. මොකද මේ යෝජනාවලිය අපි ඉදිරිපත් කර ඇත්තේ දෙමළ ජනතාවට උපරිම සාධාරණත්වය ඉෂ්ට කිරීමටයි. ඉතින් එවැනි දේකට කොටින්ට විරුද්ධ වී සිටින්න පුළුවන්ද? බෑ.

මෙයට එකඟ නොවුණහොත් අවසානයේ සිදුවන්නේ කොටි සංවිධානය කොන්වීමයි. ඒ හරහා දෙමළ ජනතාව තව තවත් දකුණේ දේශපාලනය වෙත දිනා ගැනීමට හැකිවෙනවා.

අපිට මෙහිදී වැදගත් වෙන්නේ කොටි සංවිධානය නොවේ, දෙමළ ජනතාව. දෙමළ ජනතාවට පිළිගත හැකි දේශපාලන විසඳුමක් ඉදිරිපත් කරන්න පුළුවන් නම්, කොටි සංවිධානය නිකම්ම නිෂ්ක්‍රිය වී යනවා.

ඊ.පී.ඩී.පී. සංවිධානයත් කාලයක් දෙමළ රාජ්‍යයකට සටන් කළා. නමුත් 1987 දී අත්සන් කළ ඉන්දු ලංකා ගිවිසුම හා පළාත් සභා ක්‍රමය හරහා අපි ප්‍රසිද්ධ දේශපාලනයට ප්‍රවිෂ්ට වුණා. එදා කොටි සංවිධානයට එහෙම එන්න තිබුණා. නමුත් ඔවුන් ආවේ නෑ. එහෙම ආවා නම් අද මේ වගේ යුදමය ප්‍රශ්නයක් නැති වෙන්න තිබුණා.

ඒක නිසා තමයි මම දැනුත් කියන්නේ, පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරලා උපරිම බලය බෙදා හැරීමක් කර මේ ප්‍රශ්නය විසඳීම උදෙසා රජය යළිත් උත්සාහ කළ යුතුයි කියලා.

***අමාත්‍ය මහාචාර්ය තිස්ස විතාරණ ප්‍රමුඛ විද්වත් කමිටුව මගින් උතුරු නැගෙනහිර ප්‍රශ්නය විසඳීම උදෙසා පසුගියදා යෝජනා වලියක් ඉදිරිපත් කළා. එයට ජ.වි.පෙ. හා ජාතික හෙළ උරමයේ දැඩි විරෝධය එල්ල වුණා. එම යෝජනාවලිය ගැන ඔබගේ අදහස කුමක්ද?***

තිස්ස විතාරණ කමිටු යෝජනාවලිය මෙම ප්‍රශ්නයට ආරම්භයක් විතරයි. මෙහි යම් යම් පැටලිලි සහගත තැන් තිබෙන්න පුළුවන්. නමුත් අපි ඒවා සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගත යුතුයි. එතකොට බොහෝ පැටලලි වලට විසඳුම් ලැබේවි.

***රනිල් වික්‍රමසිංහ මහතා අගමැතිව සිටියදී කොටි නායක වේළුපිල්ලේ ප්‍රභාකරන් සමග අත්සන් කළ සටන් විරාම ගිවිසුමට පෙබරවාරි 22 වැනදාට වසර 05ක් සපිරෙනවා. මෙම ගිවිසුම ඊට පෙර අහෝසි කළ යුතු බවට ජ.වි.පෙ. හා ජාතික හෙළ උරුමය රජයට බල කළා. මේ ගැන ඔබේ අදහස කුමක්ද?***

රනිල් වික්‍රමසිංහ මහතා සහ ප්‍රභාකරන් අතර අත්සන් කළ මෙම සටන් විරාම ගිවිසුම බැලු බැල්මට වැරදියි. මෙහි තිබෙන්නේ එක් පැත්තකට බර ඒකාධිකාරී බලයක් කොටි සංවිධානයට හිමිවන ආකාරයේ ස්වරූපයක්. මෙම ගිවිසුමේ වැරදි ස්වභාවය අපි ඒ දවස්වලම රනිල් වික්‍රමසිංහ මහතාට දැනුම් දුන්නා. නමුත් වැඩක් වුණේ නෑ. ඔහු එය පිළිගත්තේ නෑ. අපි දැක්වූ අනතුරු ඇඟවීම් හඳුනා ගෙන රනිල් වික්‍රමසිංහ ක්‍රියා කළා නම් මේ වගේ ප්‍රශ්න මතු වෙන්නේ නෑ.

අද ජ.වි.පෙ. හා හෙළ උරුමය ගිවිසුම අහෝසි කළ යුතු බවට හඬ නගනවා. නමුත් අද එහෙම ගිවිසුමක් තිබෙනවාද කියලා කාටවත් හැඟීමක්වත් නෑ. ඒක අහෝසි නොකළත්, අහෝසි කළා වගේ තමයි තියෙන්නේ.

ගිවිසුම් ගැහුවා කියලා කොටි සටන් විරාම ගිවිසුම කඩ කළේ නැද්ද? රජයේ හමුදා ප්‍රතිප්‍රහාර එල්ල කළේ නැද්ද? අද නැගෙනහිර දරුණු යුද්ධයක් කෙරෙනවා. සටන් විරාම ගිවිසුමක් කියලා එකක් තිබෙනවාද? නැද්ද? කියලාවත් කව්රුත්වත් දන්නේ නෑ. ඒක නිසා මම හිතන ආකාරයට එම ගිවිසුම එතරම් ප්‍රායෝගික එකක් නොවේ.

ජ.වි.පෙ. හෝ හෙළ උරුමය ගිවිසුම අහෝසි කළයුතු බවට හඬ නගන්න පුළුවන්. මොකද ඒක ඒ අයගේ දේශපාලන ස්ථාවරය විය හැකියි. නමුත් මම ඒක ගැන මොකක්වත් කතා කරන්න යන්නේ නෑ.

***විපක්ෂයේ මන්ත්‍රීවරු 18ක් ආණ්ඩුවට එක්කර ගෙන ඔවුන්ට ඇමැති සහ නියෝජ්‍ය ඇමැතිධුර ලබා දී තිබෙනවා. මේ ගැන ඔබේ අදහස කුමක්ද?***

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා මෙතෙක් කලක් පවත්වා ගෙන ගියේ සුළුතර ආණ්ඩුවක්. නමුත් රටේ ප්‍රශ්න විසඳීම උදෙසා ශක්තිමත් ආණ්ඩුවක අවශ්‍යතාව දැනෙනවා. එහිදී රාජපක්ෂ ජනාධිපතිවරයාට ආණ්ඩුව ශක්තිමත් කිරීමට නම්, ප්‍රධාන වශයෙන් පියවර දෙකක් ගැනීමට සිදුවෙනවා. එකක් මහ මැතිවරණයකට යෑම. අනෙක විපක්ෂයේ සහයෝගය ලබා ගැනීම.

නමුත් මෙතනදී මහ මැතිවරණයකට යෑමේ ඉක්මන් අවශ්‍යතාවක් දැනෙන්නේ නෑ. ඊට හේතුව තමයි ආණ්ඩුවට සහයෝගය දෙන්න විපක්ෂයේ මන්ත්‍රීවරු පිරිසක් ඉදිරිපත් වීම. ඉතින් රටේ වගකිව යුතු ප්‍රධාන පුරවැසියා වශයෙන් ජනාධිපතිවරයා හොඳයි කියන තීරණය කල්පනා කර ගන්න ඇති. ඒක ගැන වරදක් කියන්න බෑ. කාටත් වාදබේද ඉවතලා එකතු වී හොඳ දෙයක් කරන්න පුලුවන් නම්, ඒක ඉතා හොඳ දෙයක් වෙන්න පුළුවන්.

***දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් මහතාව වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධයෙන් ඊ.පී.ඩී.පී. සංවිධානය වගකිව යුතු බවට චෝදනා එල්ල වෙනවා. මේ ගැන මොකද කියන්නේ.***

ලලිත් ඇතුළත්මුදලි, රණසිංහ ප්‍රේමදාස, ඩෙන්සිල් කොබ්බෑකඩුව යන අය මැරුණ වෙලාවෙත් ඒ මිනී මැරුම්වල චෝදනා එල්ල වුණේ අපිටයි. හිටපු ජනාධිපති චන්ද්‍රිකාව පුත්තලමේදී මරන්න උත්සාහ කලා කියලාත් අපිට චෝදනා කළා. නමුත් අපි මේ කිසිම දේකට සම්බන්ධ නෑ. ඒවා

33 වන පිටට